Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

රූප පොත හා පරීක්ෂණ පොත

ශාකවල වැඩීමට ජලය අවශ්‍ය බව හඳුනා ගනිමු.

එක ම ප්‍රමාණයේ පෝච්චි දෙකක එක ම ප්‍රමාණයේ පැළ දෙකක් සිටුවා එක පැළයකට හොඳින් ජලය දමන්න. අනෙක් භාජනයට ජලය නොදමා තබන්න. දින කිහිපයකින් පසුව දැකිය හැකි දේ මෙය වනු ඇත.

නිගමනය

මෙහි දී ජලය දැමූ භාජනයේ පැළය ප්‍රාණවත් ව තිබෙන අතර ජලය නොදැමූ භාජනයේ පැළය මැල වී ගොස් ඇත. එම නිසා ශාකයක වැඩීමට ජලය අවශ්‍ය බව තහවුරු වෙයි.

යම් භාණ්ඩයක් පොළොව මත තල්ලු කිරීම හෝ ඇදීම සිදු කළ අවස්ථා

- රළු පොළොවක් මත තල්ලු කළ හෝ ඇදීම සිදු කළ හෝ අවස්ථාවක්
- සුමට පොළොවක් මත තල්ලු කළ හෝ ඇදීම සිදු කළ අවස්ථාවක්

සුමට පොළොව **රළු පොළොව**

- මෙම අවස්ථා පිළිබඳ අත්දැකීම් ලබා දීමට සිසුන් යොමු කරන්න.
- වඩාත් පහසුවෙන් තල්ලු කිරීම හෝ ඇදීම හෝ සිදු කළ හැකි වූයේ කුමන අවස්ථාවේ දැයි විමසන්න.
- එම භාණ්ඩය ම ආනත තලයක ඉහළට තල්ලු කිරීමට සිසුන් යොමු කරන්න. එහි දී මුහුණ දුන් අපහසුතාවය විස්තර කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- එවැනි කාර්යයක් පහසු කරගැනීම සඳහා කප්පි යොදා ගත හැකි බව පෙන්වා දෙන්න.

යමක් තල්ලු කිරීමේ පහසු අපහසු බව



සුමට පොළොව **රළු පොළොව**

සුමට (මෘදු) බිමක යමක් තල්ලු කිරීම පහසු ය. නමුත් රළු බිමක යම් දෙයක් තල්ලු කරගෙන යාම පහසු නොවේ.

කප්පි භාවිතයේ වාසි



බෑවුම් සහිත තැනක යම් දෙයක් ඉහළට තල්ලු කිරීමට වඩා කප්පියක් භාවිත කොට ඉහළට ගැනීම පහසු වේ. විශාල බරක් ඉහළට ගැනීමට බහුල ව මෙම කප්පි භාවිත කරයි. (උදාඃ- දොඹකරය)

කප්පිය හඳුනා ගනිමු.



මෙවැනි කප්පි මගින් යම් බරක් ඉහළට ගත හැකි ය. (උදාඃ- ළිඳකින් වතුර ඇදීම, විදුලි සෝපාන, දොඹකරය)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

දමිළ ජාතිකයන් විසින් නිර්මාණය කරනු ලබන කෝලම් සැරසිලි

- මේ සඳහා සිසුන්ගේ හැකියාවලට ගැළපෙන ආකාරයේ නිර්මාණ භූමියෙහි සුදුසු ස්ථානයක ඇඳ ඒවා වර්ණ ගැන්වූ පොල්කුඩු යොදා ගනිමින් අලංකාර කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මුස්ලිම් ජාතිකයන් හා දමිළ ජාතිකයන් විසින් නිර්මාණය කරනු ලබන අත්ල යොදා ගනිමින් කරන මරතොන්ඩි සැරසිලි.
- මේ සඳහා සිසුන්ට තම අත්ලෙහි සටහනක් කඩදාසියක් මත පිටපත් කර ඒ තුළ විවිධ රටා ඇඳීමට අවස්ථාව ලබා දීම කළ හැකි ය.
- සිංහල හා බර්ගර් ජාතිකයන් විසින් උත්සව අවස්ථාවන් සඳහා නිර්මාණය කරනු ලබන සැරසිලි මේ සඳහා නිවෙස අලංකාර කිරීම සඳහා යොදාගත හැකි පහත දැක්වෙන ආකාරයේ කඩදාසි නිර්මාණ සිදු කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

උදාඃ-
- සෙ.මී. 20 පමණ දිග පළල ඇති සමචතුරස්‍රාකාර වර්ණවලින් යුත් කඩදාසි පහත රූපසටහන 1, 2, 3, 4 රූපවල දැක්වෙන පියවර ආකාරයට නවා ගන්න.
- එය 5 වන රූප සටහනේ දැක්වෙන ආකාරයට කඩදාසිවල කොටස් වෙන් නොවන සේ කපා ගන්න.



රූපය 1 රූපය 2 රූපය 3 රූපය 4 රූපය 5 රූපය 6


රූපය 7

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- මේ අකාරයේ කැපුම් යෙදූ කඩදාසිය නැවත සම්පූර්ණයෙන් දිග හරින්න. (රූපය 6)
- එහි ABCD වශයෙන් දක්වා ඇති කෙළවරවල් එක් කර ගම් තවරා ගන්න.
- මේ අකාරයට සකස් කළ කොටස් කීපයක් එකට එකතු කර අලංකාර සැරසිල්ලක් නිර්මාණය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

ශාකයක කොටස්





- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- පහත ද්‍රව්‍ය සිසු කණ්ඩායම්වලට ලබාදෙන්න.
  - කුඩා ප්‍රමාණයේ කාඩ්බෝඩ් පෙට්ටියක් (5"x5"x5" පමණ ප්‍රමාණයේ)
  - නූල් චුම්බක
  - කඩදාසි ඇමුණුම් කටු

- විවිධ වර්ණ කඩදාසි

- විවිධ වර්ණ කඩදාසිවලින් කුඩා ප්‍රමාණයේ සමනලයන්, මාළුන්, කුරුල්ලන් හා මල්වල ආකෘති කපා ගැනීමට සිසුන් යොමු කරන්න.
- ආකෘති සිසුන්ට හොඳින් දර්ශනය වීම සඳහා කාඩ්බෝඩ් පෙට්ටියේ දෙපැත්තක් (ප්‍රතිවිරුද්ධ පැති 2කින්) කපා ඉවත් කර ගන්න.
- කාඩ්බෝඩ් පෙට්ටියේ යටි පැත්තේ සිදුරු දෙකක් (සුදුසු දුරකින්) විද ගැනීමට සිසුන් යොමු කරන්න.
- නූල් 2ක් එම සිදුරු තුළින් යවා ඇමුණුම් කටුවලට අමුණා, එම ඇමුණුම් කටුවල සත්ත්ව ආකෘතීන් රඳවා ගැනීම සඳහා මඟ පෙන්වන්න.
- කාඩ්බෝඩ් පෙට්ටියේ ඉහළින් ද සිදුරු දෙකක් විදින්න. ඒ තුළින් නූල් දෙකක් යවා ඒවායේ පෙට්ටිය තුළ ඇති කෙළවරවල චුම්බක කැබලි දෙකක් ගැට ගසන්න.
- වමත සහ දකුණත භාවිත කරමින් ආකෘති වෙත චුම්බක කැබලි ළං කර චලනය කරමින් සතුටු වීමට අවස්ථාව ලබා දෙන්න.

නිගමනය

චුම්බකවලට ලෝහ ආකර්ෂණය වන නිසා ලෝහ ඇමුණුම් කටු රැඳ වූ ආකෘති නොවැටී පවතී.

අප එදිනෙදා භාවිතා කරන විවිධ උපකරණ හා භාණ්ඩ භාවිතයේ දී යම් යම් දේ ගැට ගැසීමට සිදුවීම

- මෙසේ ගැටගැසීම භාවිත කිරීම නිසා එම භාණ්ඩ හා උපකරණ භාවිතය පහසු වීම. එම භාණ්ඩයේ උපකරණයේ ආරක්ෂාව හා කල් පැවැත්ම පවත්වා ගැනීමට ඉවහල්වන බව ද පෙන්වා දෙන්න.

  උදා:-
  - සපත්තුවේ ලේසය
  - කොණ්ඩය ගොතා ගැට ගසන පටිය
  - කෑම පෙට්ටිය ගැට ගසන අත් පිස්නාව
- මෙවැනි දේ භාවිත කිරීමේදී ගැට ගැසීමට හුරුවක් ලැබීම සඳහා සෑම සිසුවෙකු ම පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- ඒ සඳහා සෙන්ටිමීටර 30 පමණ දිග සෙන්ටිමීටර 4 පමණ පළල රෙදි පටියක් හා රවුම් හැඩයක් සහිත කුඩා ලී කැබැල්ලක් හෝ බට කැබැල්ලක් හෝ බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- ඒවා යොදා ගනිමින් ගැට ගැසීමේ මූලික කුසලතා ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



- මේ ආකාරයට ම සිසුන් රැගෙන ආ කෑම පෙට්ටිය හා අත් පිස්නාව යොදා ගනිමින් කෑම පෙට්ටිය තුළ ඇති ආහාර පිටතට නොඑන සේ ආරක්ෂිත ව එය ගැට ගැසිය හැකි ආකාරය සිසුන්ට හුරු කරවන්න.
- නිවැරදි ව අත් පිස්නාව ගැට ගැසීමෙන් ආහාර අපතේ නොයන බවත්, පාසල් බෑගය පිරිසිදු ව පවත්වා ගත හැකි බවත් පෙන්වා දෙන්න.
- එසේ ම ජලය රැගෙන එන බෝතලය නිවැරදි ව වැසීමත්, එය සිරස් ව බෑගය තුළ රඳවා ගැනීමත් වැදගත් වන බව ද මතු කර දක්වන්න.
- මේ අනුව තමා නිතර භාවිතා කරන උපකරණ නිවැරදි ව පරිහරණය කිරීමට අප විසින් පුරුදු පුහුණු විය යුතු බව ද සිසුන්ට අවධාරණය කරන්න.

බිලැන්කට් මැස්ම

- බිලැන්කට් මැස්ම පිළිබඳ මූලික හුරුකම් ලැබීම සඳහා සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- ඒ සඳහා සෙ.මී. 20 පමණ දිග හා සෙ.මී. 10 පමණ පළල බ්‍රිස්ටල් බෝඩ් කැබැල්ලක්, ටැපැස්ට්‍රි ඉඳිකටුවක් හා වූල් නූලක් බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- එම බ්‍රිස්ටල් බෝඩ් කැබැල්ලේ දෙපැත්ත පහත රූපයේ දක්වා ඇති ආකාරයට බිලැන්කට් මැස්ම භාවිත කරමින් මැසීම සඳහා සිසුන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

විවිධ දේ යොදා ගනිමින් ආහාර වර්ගවල ආකෘති නිර්මාණය කිරීම

උදා:-

- බැලුනයක් පුම්බා කට ගැට ගසා ඒ වටා ගම් තවරා බැලුනය නොපෙනෙන සේ මුං ඇට ඇලවීමෙන් දෙල් ගෙඩියක් නිර්මාණය
- බිත්තට කටු යොදා ගනිමින් වම්බටු ගෙඩියක් නිමවා එය වර්ණ ගන්වා කටුවක් යොදා සකස් කිරීම.
- ටොනික් මූඩිවල දම් පාට කඩදාසි අලවා මිදිවැලක් නිර්මාණය කර ගැනීම.



අතීතයේ මුතුන් මිත්තන් ජලය පිරිසිදු කර ගැනීමට සිදු කළ දේ හා වර්තමානයේ සිදු කරන දේ

අතීතයේ ජලය පිරිසිදු කරගත් ක්‍රම	වර්තමානයේ ජලය පිරිසිදු කරගන්නා ක්‍රම
▪ ඉඟිනි ඇට / අඟුරු ජලයට දැමීම	▪ පෙරන භාවිතය (filter)
▪ රෙදිකඩකින් පෙරා ගැනීම	▪ ක්ලෝරීන් යෙදීම
▪ උණුකර නිවා ගැනීම	▪ ජල කරාම සඳහා පෙරන යෙදීම

- මෙවැනි විවිධ ක්‍රම යොදා ගැනීමෙන් භාවිතා කරන ජලය පිරිසිදු කර ගැනීමට අතීතයේ මෙන් ම වර්තමානයේ ද මිනිසුන් උත්සාහ ගන්න බව පෙන්වා දෙන්න.
- අපගේ පියවි ඇසට ජලය පිරිසිදු ලෙස පෙණුනත්, බොහෝ අවස්ථාවල දී ජලය අපිරිසිදු ව පැවතිය හැකි බව පෙන්වීම සඳහා සිසුන් පහත ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- පෙරීමෙන් ජලය පිරිසිදු කර ගත හැකි දැයි සොයා බැලීම සඳහා පහත ආකාරයේ ක්‍රියාකාරකමක ගුරුවරයා සමඟ යෙදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මඩ මිශ්‍ර වූ ජලය හෝ වර්ණ ජලය හෝ සාම්පලයක් සපයා ගන්න.
- රූපයේ දැක්වෙන පරිදි සරල ඇටවුමක් සකසා ගන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



- පතුල සිදුරු කරගත් යෝගට් කොප්පවල පතුලට පුළුන් හෝ සුදු පැහැති රෙදි කැබලි හෝ යොදා ගන්න. (යෝගට් කෝප්ප 3ක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ යොදා ගත හැකිය.)
- සපයා ගත් මඩ සහිත/ වර්ණවත් ජල සාම්පලයෙන් කොටසක් විනිවිද පෙනෙන බඳුනකට (වතුර වීදුරුවක්) වෙන් කරගන්න.
- ඉතුරු කොටස, ඇටවුමෙහි ඉහළින් ම ඇති යෝගට් කෝප්පයට වත් කරන්න.
- යෝගට් කෝප්ප එකිනෙකින් එම ජල සාම්පලය පෙරී එන අයුරු නිරීක්ෂණය කර අදහසස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඉහළින් ම ඇති යෝගට් කෝප්පයෙන් පෙරී එන දියරය පෙර යොදා ගත් බනඳුට සමාන වෙනත් විනිවිද පෙනෙන බඳුනකට එකතු කර ගන්න. එය පළමු සාම්පලයෙන් වෙන් කර ගත් ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් වන සේ ලබා ගන්න.
- එම දියර විනිවිද පෙනෙන සිසුන් එක ළඟ තබා නිරීක්ෂණය කර අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙරහන් ලෙස යොදා ගත් සුදු පැහැති රෙදි කැබලිවලට හෝ පුළුන්වලට හෝ සිදු වී ඇති වෙනස්කම් නිරීක්ෂණයට ද සිසුන් යොමු කරන්න. අවශ්‍ය පරිදි සිසුන්ට අත්කාව ලබා දෙන්න.

සරල ජල පෙරණය හඳුනා ගනිමු



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මෙහි දී යටින් සිදුරු කරගත් යෝගට් කෝප්ප තුළට පුළුන් දමා ඉහළ ම ඇති යෝගට් කෝප්පයට මඩ මිශ්‍ර ජලය දැමූ විට ඒවා පෙරෙමින් එකිනෙක යෝගට් කෝප්ප තුළින් පැමිණ යට ම ඇති භාජනයට වැටේ. යෝගට් කෝප්ප ගණන වැඩි කර ගැනීම තුළින් ජලය තවත් හොඳින් පෙරාගත හැකිය ය.



- පැහැදිලිව පෙනෙන බිත්ති සහිත විනිවිද පෙනෙන කට ලොකු වීදුරු බෝතල් ගන්න. (හිස් ජෑම් බෝතල් මේ සඳහා සුදුසු ය.)
- එම බඳුන්වලට පුළුන් පුරවා ඒවාට මුං/ බෝංචි හෝ මෑ බීජ කිහිපයක් දමන්න.
- පුළුන් තෙමෙන පරිදි ජලය ස්වල්පයක් ඒ මත ඉසින්න.
- පසු කණ්ඩායම්වලට එම බඳුන් ලබා දී පහත කරුණු ඔස්සේ මං ඇටවල (හෝ වෙනත් බීජවල) හෝ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න. නිරීක්ෂණය සඳහා අත්කාව ද ලබා දෙන්න.
- මෙම බීජ පැළවීමේ දී දක්නට ලැබෙන පහත සඳහන් දේ පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
    - මුලින් ම දක්නට ලැබෙන කොටස
    - මුල් ඇදෙන ආකාරය
    - මුල් වැඩෙන දිශාව
    - කඳ දික්වන ආකාරය
    - කඳ වැඩෙන දිශාව
    - පත්‍ර හටගන්නා ආකාරය
    - එක් එක් කොටසේ පාට වෙනස් වන ආකාරය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සරලව කප්පියක් සෑදීම



සෙල්ලම් ආලෝක සංඥා පද්ධතියක් සෑදීම



පස සෝදායාමට ශාකවල බලපෑම පරීක්ෂා කිරීම



මෙහි දී ඉහතින් ජලය දැමූ විට තණකොළ සහිත බිම හරහා භාජනයට එන ජලය පිරිසිදු ය. තණකොළ රහිත බිම හරහා එන ජලය මඩ පැහැති ය. මින් නිගමනය කළ හැක්කේ, තණකොළ සහිත බිමෙහි පස සෝදා නොයන බවයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

චන්ද්‍රග්‍රහණය හා සූර්යග්‍රහණය සිදුවන අයුරු



චන්ද්‍ර ග්‍රහණය



සූර්ය ග්‍රහණය

තරු රටා

දඩයක්කාරයා


මහා වලසා

කුඩා වලසා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



කුරුසය



සිංහ

ගෝනුස්සා

රථවාහන ආලෝක සංඥා පද්ධතිය

වාහනය නතර කරන්න.

රථය ගමනට සූදානම් කරන්න.

ගමන ආරම්භ කරන්න.

පදිකයින්ගේ ආලෝක සංඥා පද්ධතිය

පාර හරහා මාරුවීම නොකළ යුතුයි.

පාර හරහා මාරුවන්න.

සිතියමක දක්වන මාර්ග සංකේත

අධිවේගී මාර්ගය (දම් පාට)

මහා මාර්ගය (රතු පාට)

දුම්රිය මාගර්ය (කළු පාට)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

රූපික ප්‍රකාශන

බොජුන් හල

ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ය


බිඳෙන සුලු ය

ගුවන් තොටුපළ

ආබාධිත අය සඳහා

දුරකථන පහසුකම්

විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝන උපාංග පරිසරයට බැහැර නොකරන්න

දණ්ඩ චුම්බක ආකර්ෂණය හා විකර්ෂණය හඳුනා ගැනීම



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සුළං ටකය හඳුනා ගැනීම



මෙහි දී තහඩු කැබැල්ලට සුළඟ වදින විට එය චලනය වේ. ඒ සමඟ යටින් එල්ලා ඇති ඇණ හිස් වීදුරු බෝතලයේ වදින අතර, එයින් "ටින් ටින්" ගා ශබ්දයක් නැගේ. එවිට ගොඩබිමට එන සතුන් බිය වී ආපසු යයි. මෙය අතීතයේ වගා බිම් ආරක්ෂාවට යොදාගත් පරිසර හිතකාමී ක්‍රමයකි.

ටිෂු කඩදාසි තුළින් වර්ණවත් ජලය ගමන් කරන අයුරු



මෙහි දී වීදුරුවල ඇති වර්ණවත් ජලය ටිෂු කඩදාසි තුළින් ගමන්කොට වර්ණ එක්වී අපූරු වර්ණ සෑදෙයි.

වියළි කෝෂ හඳුනාගනිමු



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

බල්බය හඳුනාගනිමු



බීජයක් පැළවීමට අවශ්‍ය සාධක පරීක්ෂා කරමු.



නිගමනය

මෙහි දී පොල් තෙල් තට්ටුවක් දමූ G සහ S භාජනවල බීජ පැළවෙන්නේ නැත. බඳුන තුළට වාතය ඇතුළු නොවීම, එයට හේතුව වේ. එමෙන් ම N භාජනයේ ජලය රත් කිරීම නිසා එහි වාතය නොමැති වීමෙන් බීජ නොපැළ වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සිදුරු කැමරාව හඳුනා ගනිමු



නිගමනය

සිදුරු කැමරාවකින් යමක් දෙස බැලූ විට එය පෙනෙන්නේ යටිකුරු ලෙස යි.

මුහුදු ජලයෙන් ලුණු වෙන්කර ගනිමු.



මෙහි දී ලුණු සහිත භාජනය හොඳින් හිරු එළිය වැටෙන ස්ථානය තැබූ විට දින කිහිපයකින් ජලය ඉවත් වී ගොස් ලුණු ඉතුරු වී තිබෙන ආකාරය දැකිය හැකි ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

අයිස් කැට පරීක්ෂාව

නිගමනය

මෙහි දී අනෙක් භාජන දෙකට ම වඩා ඉක්මනින් උණු ජල බඳුනේ අයිස් කැට දිය වේ.

සුළං දිශා දර්ශකය හඳුනා ගනිමු

මෙය සුළඟ හමන දිශාව හඳුනාගන්නා උපකරණය යි. මෙහි දී වැදගත් ම දෙය වන්නේ, සුළං දිශා දර්ශකයේ ඊතලයේ ඊ හිස යොමුවන්නේ සුළඟ හමා එන දිශාවට වීමයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ශ්‍රී ලංකාවේ කීර්තිනාමය නැංවීමට දායක වූ පුද්ගලයින්


එස්. මහින්ද හිමි


අනගාරික ධර්මපාලතුමා

සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මහතා

ආනන්ද කුමාරස්වාමි මහතා

හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා


ආතර් සී. ක්ලාක් මහතා

ආචාර්ය ටී.බී. ජයා මහතා


ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා

ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා

ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා 1877 අගෝස්තු 22 වැනි දින කොළඹ, කොල්ලුපිටියේ දී උපත ලැබී ය. ඔහු විසින් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ හා නිබන්ධන ප්‍රමාණාත්ම ව මෙන්ම ගුණාත්මක බවින් ද අතිමහත් ය. එම සංඛ්‍යාව 500 ට වඩා වැඩි ය. මෙතුමා ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන්, ලතින්ථ ග්‍රීක්, සංස්කෘත, පාලි යන භාෂාවල විශිෂ්ටත්වයට පැමිණියෙකි. නීතිවේදියෙකු හා පරිවර්තකයෙක් විය. බෞද්ධ ධර්ම ග්‍රන්ථ පාලි බසින් ඉංග්‍රීසියටත්, හින්දු ධර්ම ග්‍රන්ථ දෙමළ බසින් ඉංග්‍රීසියටත් පරිවර්තනය කරන ලදී.

ලන්ඩනයේ වයික් ලිප් විද්‍යාලයය ඔහුගේ ගුරු ගෙදර විය. ඔහුගේ ප්‍රථම ශාස්ත්‍රීය ලේඛනය 'ලංකාවේ කළු හා මිනිරන්' වාර්ක සංග්‍රහය යි. වර්ෂ 1905 දී 'ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය' ඇරඹූ කුමාරස්වාමි මහතා 'සිලෝන් නැෂනල් රිවීව්' (Ceylon national review) සඟරාවේ සමාරම්භක සංස්කාරකවරයා විය. ආනන්ද කුමාරස්වාමි වූ කලි ලංකාවෙන් ලොවට දායාද කළ ප්‍රමුඛ පෙළේ දාර්ශනිකයෙකි. පෙරදිග කලා සම්පත් සංරක්ෂණය කිරීම භාරව සිටි මොහුගේ අත් පිටපත් ලිපි ලේඛන ආදිය බොස්ටන් ලලිත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

කලා කෞතුකාගාරයෙහි අදත් සංරක්ෂණය කර තිබේ. 'මධ්‍යකාලීන සිංහල කලා', 'ජාතික අපේක්ෂණ', 'ඉන්දියානු ඉන්දුනීසියානු කලාවේ ඉතිහාසය' මොහු විසින් රචිත කෘති ය.

ඔහු වර්ෂ 1947 සැප්තැම්බර් මස 09 දින ඇමරිකාවේ බොස්ටන් නුවර දී මිය ගියේ ය.

ආචාර්ය ටී.බී. ජයා මැතිතුමා

වර්ෂ 1890 ජනවාරි 01 වැනි දා උපත ලැබූ ටී.බී. ජයාගේ ළමා කාලය ගැමි දරුවන් අතර ගෙවුණු සරල දිවි පෙවෙතක් විය. ඔහු කොටහේන සාන්ත පාවුළු විදුහලෙන් ද, කොළඹ ශාන්ත තෝමස් විදුහලෙන් ද අධ්‍යාපනය ලැබුවේ ය.

වර්ෂ 1910 ජනවාරි මස මහනුවර ධර්මරාජ විදුහලේ ගුරුවරයෙකු ලෙස වැඩ භාර ගත් මෙතුමා ලතින්, ග්‍රීක්, ආර්ථික විද්‍යාව, ඉතිහාසය වැනි විෂයන් මගින් ශිෂ්‍යයන් තුළ දේශාභිමානය, එඩිතර බව හා පෞරුෂත්වය ගොඩනැගෙන පරිදි ඉගැන්වීම් කටයුතුවල යෙදිණි.

වර්ෂ 1917 දී කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස වැඩ කරන කාලයේ රට භාර ගැනීමට ඉවහල් වන අන්දමේ පූර්ණ අධ්‍යාපනයක් ශිෂ්‍යයක්ට ලබා දුන්නේ ය.

වර්ෂ 1921 දී කොළඹ මරදාන සහිරා විද්‍යාලයයේ විදුහල්පති විය. එකල තිබූ කොළඹ කයිරියා බාලිකා පාසල සහ ඩෙන්හැම් ඉංග්‍රීසි පාසල ආරම්භ කරන ලද්දේ මෙතුමා විසිනි. අලුත්ගම, ගම්පොළ, මාතලේ සහ පුත්තලම නගරවල සහිරා විද්‍යාලයයන් ද, අලුත්ගම, අඩ්ඩාලච්චේන නගරවල ගුරු විදුහල් ද ආරම්භ කළේ ය. ජාතික කොඩිය හා ජාතික ගීය සම්පාදන කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ ආචාර්ය ටී.බී. ජයා මහතා වර්ෂ 1960 දී සවුදි අරාබියාවේ දීනා නගරයේ දී මෙලොවින් සමු ගත්තේ ය.

ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා

ආචාර්ය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර ශ්‍රේෂ්ඨ අධ්‍යපනඥයකු මෙන් ම ජාතික වීරයෙක් ද වේ. මෙතුමා වර්ෂ 1894 ඔක්තෝබර් මස 18 දින උපත ලැබී ය.

කන්නන්ගර මැතිතුමා මහා භාරතයේ උපත ලැබී නම් ඔහු එහි දී දෙවියෙකු වශයෙන් පුද ලබනු ඇතැ යි වර්ෂ 1945 ලංකාවේ සිටි ඉන්දියානු නියෝජිත එම්. එස්. අනේ පවසා ඇත. අම්බලන්ගොඩ වෙස්ලියන් සහ ගාල්ලේ රිච්මන්ඩ් විදුහල්වල ඉගෙනුම ලැබූ ඔහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත් රටවල හොඳ ම ශිෂ්‍යයාට හිමි ත්‍යාගය ද දිනා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ගත්තේ ය. රිච්මන්ඩ් විද්‍යාලයයේ ගුරුවරයෙකු ලෙස ගුරු වෘත්තියට පැමිණි ඔහු මොරටුව වේල්ස් විද්‍යාලයය සහ කොළඹ වෙස්ලි විද්‍යාලයයේ ද සේවය කළේය. වර්ෂ 1931 සිට ක්‍රි.ව. 1946 තෙක් කාලයේ ලංකාවේ අධ්‍යාපන ඇමති ව සිට කරන ලද සේවාව අතිමහත් ය.

පළමු වන ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලයය තෙක් නිදහස් අධ්‍යාපනය නොමිලේ ලබා දීම, මවු බස අධ්‍යාපන මාධ්‍යය බවට පත් කිරීම, පාසල් රජයට පවරා ගැනීම, මාධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම, සෑම ළමයෙකුට ම තම දෙමවුපියන්ගේ ආගම ඉගැන්වීම, ආදායම් අඩු ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබා දීම, පොදු විෂය නිර්දේශයක් සකස් කිරීම, විෂය බාහිර කටයුතු සංවිධානය, පාසල්වලට ක්‍රීඩා පිට්ටනි ලබාදීම, සංගීතය, නැටුම්, මලල ක්‍රීඩා ඉගෙනීමට අවස්ථා ලබාදීම, දෙවන පන්තියේ සිට ඉංග්‍රීසි විෂය ඉගෙනීමට අනිවාර්යය කිරීම වැදගත් විය. මෙම නවීකරණ ඔස්සේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ නව නැම්මක් ඇති වූ අතර ඒ වකවානුව වන විට අධ්‍යාපනය අතින් ආසියාවේ දියුණු ම රට බවට ලංකාව පත් විය. පරාදීන යුගයක වුව ද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාව වෙනස් කිරීමේ කාර්යයට උරදීමෙන් ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර නමැති ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයා ජාතික වීරයෙකු වශයෙන් ද සැලකෙන අතර ශ්‍රී ලාංකිකයන්ගේ අධ්‍යාපනයේ පියා යනුවෙන් විරුදාවලිය ලැබී ය.

එස්. මහින්ද හිමි

වර්ෂ 1901 දී ටිබෙට් රටේ සීකිම් ප්‍රදේශයෙහි උපත ලද එස්.කේ. තෂිනම්ගල් වයස අවුරුදු 12 දී කොළඹ විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් ව පාලි, සිංහල, සංස්කෘත ඉගෙන ගත්තේ ය. මහාබෝධි විද්‍යලයයෙන් ඉංග්‍රීසි ද පොල්ගස්දූව ආරාමයෙන් ප්‍රාචීන භාෂා ද හැදෑරී ය. රත්ගම සිරිචූලසුමන හිමියන්ගේ ශිෂ්‍යයෙකු ලෙස දොඩන්දූවේ ශෛලබිම්බාරාමටේ දී සීකිම් මහින්ද නමින් පැවිද්ද ලබා ගත්තේ ය.

ඒ හිමිපාණෝ වර්ෂ 1934-1396 කාලය තුළ කොළඹ ආනන්ද විද්‍යාලයයේ සිංහල, පාලි, බුද්ධ ධර්මය ඉගැන්වූහ. පන්සල සහ ගම වෙනුවෙන් විශාල සේවාවක් කළ උන් වහන්සේ විසින් නව ලංකා දහම් පාසල හා ඉංග්‍රීසි පාඨශාලාව ආරම්භ කරන ලදී. එමෙන් ම සතර පේරුවේ ගම්වලින් බෙහෙත් එකතු කොට නොමිලේ බෙහෙත් දෙන පින් බෙහෙත් ශාලාවක් පිහිටවූහ. ගව මස් කෑමෙන් ගම්මුන් වළකාලීමට තදින් ම ක්‍රියා කළහ. මුන් වහන්සේ පානදුරේ තොටගමුවේ උපසම්පදා භික්ෂු මණ්ඩලයේ ලේකම් තනතුර දැරූහ.

එස් මහින්ද හිමියන් ගද්‍ය, පද්‍ය කෘති 40ක් පමණ රචනා කර ඇත. ලංකා මාතා, නිදහසේ මන්ත්‍රය, නිදහසේ දැහැන, දරු නැළවිල්ල ආදී ග්‍රන්ථ ශ්‍රී ලාංකිකයන්ගේ දේශාභිමානය හැඟීම් ජනිත කරවීමට සමත් විය. කොළඹ යුගයේ ජනප්‍රිය කවියකු වූ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මෙතුමන්ගේ මුල් ම කෘතිව වශයෙන් ඔවා මුතුදම ද අවසාන කෘතිය වශයෙන් ශ්‍රී පාදය ද සැලකේ. දේශාභිමානී හැඟීමෙන් කටයුතු කොට ජාතික මෙහෙවරක යෙදුණු මෙතුමාණෝ වර්ෂ 1951 මාර්තු මස 14 දින අපවත් වූහ.

ආතර් සී. ක්ලාක් මැතිතුමා

දකුණු එංගලන්තයේ සමර්සෙට් ප්‍රදේශයේ මයින්හෙඩ් යන නගරයේ දී 1917 දෙසැම්බර් මස 16 වන දා ආතර් සී. ක්ලාක් මහතා උපත ලැබීය. මොහු විද්‍යාඥයකු මෙන් ම ප්‍රසිද්ධ ලේඛකයෙකි. මොහු ප්‍රසිද්ධියට පත් වූයේ වර්ෂ 1945 දී වයර්ලස් වර්ල්ඩ් යන සඟරාවේ පළ කරන ලද ලිපියකිනි. පොළොවේ සිට අහසට චන්ද්‍රිකා යැවිය හැකි ය යනුවෙන් ද එම චන්ද්‍රිකා උපයෝගී කරගෙන පණිවිඩ හුවමාරු ක්‍රමයක් නිර්මාණය කළ හැකි බව ද මොහු ප්‍රකාශ කර ඇත.

මෙතුමා වර්ෂ 1956 දී ශ්‍රී ලංකාවේ පදිංචියට පැමිණියේ ය. මොරටු විශ්ව විද්‍යාලයේ කුලපතිවරයා මෙන් ම එංගලන්තේ රාජකීය තාරකා විද්‍යාඥයන්ගේ සංගමයේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේ ය. මෙතුමාට උපාධි හා සම්මාන 38ක් පමණ පිරිනමා ඇත. නයිට් පදවියෙන් ද පිදුම් ලැබූ ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් මහතා අනූ වියැතිව සිටිය දී වර්ෂ 2008 ක් වූ මාර්තු මස 19 වන දා ශ්‍රී ලංකාවේ දී මිය ගියේ ය.

ශ්‍රී ලංකාවේ පළාත් හඳුනා ගනිමු



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ශ්‍රී ලංකාවේ නාමය ජාත්‍යන්තරයට ගෙන ගිය පුද්ගලයින්


ඩන්කන් වයිට්

සුසන්තිකා ජයසිංහ

සනත් ජයසූරිය

ලූෂන් පුෂ්පරාජ්


ඩබ්ලිව්. ඩී.
අමරදේව

මුත්තයියා මුරලිදරන්


ප්‍රේමසිරි කේමදාස

මහාචාර්ය සරත්
ගුණපාල


සිබිල් වෙත්තසිංහ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

නිදහස දිනා ගැනීමට කටයුතු කළ පුද්ගලයෝ

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි



මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි



එස්. මහින්ද හිමි

ගොංගාලේගොඩ බණ්ඩා

මොනරවිල කැප්පෙටිපොල

ඩී.එස්. සේනානායක මහතා

අපේ උරුමයක් වූ ගොක්කොළ සැරසිලි හා නිර්මාණ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මාර්ග සංඥා

බස් නැවතුම

වාහන නවත්වන ස්ථානය

පදිකයන් මාරුවන ස්ථානය

රෝහල

පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි

රථ වාහන ආලෝක සංඥා ඉදිරියෙනි

ලිස්සන සුළු මාර්ගය ඉදිරියෙනි

ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි

ගේට්ටු සහිත දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි

අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි

වට රවුම ඉදිරියෙනි

මිනිසුන් වැඩෙහි යෙදෙන ස්ථානය ඉදිරියෙනි

බීජ ව්‍යාප්ත වන ක්‍රම

සුළඟ මගින්

හොර

වරා

තොටිල

ගම්මාලු

මොනර කුඩුම්බිය

ජලය මගින්

පුවක්

කදුරු

පොල්

කුඹුක්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පිපිරීම මගින් (ස්ඵෝටනයෙන්)

කුඩලු

රබර්

ඔළිඳ

ඉපිල් ඉපිල්

සතුන් මගින් (අඟේ තැවරීමෙන්)

ඇපල

තුත්තිරි

නාගදරණ

සතුන් මගින් (ගෙඩි කා දැමීමෙන්)

රඹුටන්

අඹ

පේර

ජම්බු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ඵලය කරලක් ලෙස වැඩෙන ශාක

පතෝල

බෝංචි

බණ්ඩක්කා

මෑ කරල්

පතෝල

ඒකදේශික සතුන්

පක්ෂීන්

වළි කුකුළා

හබන් කුකුළා

පඬුවන් බස්සා

අළු දෙමලිච්චා

ක්ෂීරපායී සතුන්

කළු වඳුරා

කලවැද්දා

හික් මීයා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මත්ස්‍යයෝ

මල් පුළුටිටා

පතිරණ සාලයා

බන්දුල පෙතියා

බුලත් හපයා

යක් කටුස්සා

දිය නයා

ඕපනායක යෝධ පුස්වැල

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පළාත : සබරගමුව

දිස්ත්‍රික්කය : රත්නපුරය

- ඓතිහාසික හා ඖෂධීය වටිනාකමකින් යුක්ත ය.
- මී ගං ඉවුරට යාබද ව පිහිටා ඇත.
- දැනට හමු වී ඇති විශාලත ම පුස්වැල ලෙස සැලකේ.

කැප්ටන් ඩෝසන් කුළුණ



කැප්ටන් විලියම් ෆ්‍රැන්සිස් ඩෝසන්

පළාත : මධ්‍යම

දිස්ත්‍රික්කය : මහනුවර

- කොළඹ නුවර පාර බ්‍රිතාන්‍යයන් ඉදි කළ පළමු මහා මාර්ගයයි.
- ඒ සඳහා කැප වී සේවය කරන ලද්දේ විලියම් ෆ්‍රැන්සිස් ඩෝසන් විය.
- නමුත් මාර්ගය ඉදි කර අවසන් කිරීමට පෙර ඔහු රෝගාතුර වී මිය ගියේ ය.
- ඔහු කළ අමිල සේවය සිහිකරනු වස් 1829 දී කඩුගන්නාව නගරයේ මෙම කුළුණ ඉදිකරන ලදී.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

රිටිගල කන්ද

පළාත : උතුරු මැද

දිස්ත්‍රික්කය : අනුරාධපුරය

- මහින්දාගමනයත් ඒ හරහා ඇති වූ පැවිදි භික්ෂු ශාසනයත් පිළිබඳ සාක්ෂි පවතී.
- ශ්‍රී ලංකාවට ආවේණික ශාක හා සත්ත්ව ප්‍රජාව මෙන්ම රිටිගලට ආවේණික වූ ශාක ප්‍රජාවන්ගෙන් යුක්ත ය. (වන මී)
- වනජීවී දැඩි රක්ෂිතයන්ගෙන් එකකි.

අම්බලම

- අතීතයේ දී මගීන්ගේ ගිමන් අවශ්‍යතා වෙනුවෙන් ඉදි වූ ගිමන්හල් අම්බලම නම් වේ.
- පනාවිටිය අම්බලමේ විශිෂ්ට ම දැව කැටයම් දැකගත හැකි ය.
- රට පුරා විවිධ ස්ථානවල අම්බලම් දැකගත හැකි ය.

නාමල් උයන

පළාත : උතුරු මැද

දිස්ත්‍රික්කය : අනුරාධපුරය

- ලොව විශාලතම ම නා වනය හා රෝස තිරුවානා කන්ද වේ.
- වනවාසී රාහුල තෙරුණ් විසින් ලෝක අවධානයට යොමු කර තිබේ.
- වසර මිලියන 500කටත් වඩා පැරණි ඉතිහාසයක් මෙම රෝස තිරුවානාවලට ඇති බව කියවේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ජල පෙරණයක්



අපේ රටේ ජීවත් වන ජන වර්ග සහ ඇඳුම් පැළඳුම්

සිංහල

කාන්තා - ඔසරිය

පිරිමි - සිංහල ආරිය ඇඳුම

දෙමළ

කාන්තා - සාරිය

පිරිමි - වේට්ටිය, බැනියම

මුස්ලිම්

කාන්තා - හබායා, ඉජාහස්

පිරිමි - ජුබ්බා, තොප්පිය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

බර්ගර්

කාන්තා - ගවුම

පිරිමි - කලිසම, කමිසය, ලෝගුව

ආදිවාසීන්

කාන්තා හා පිරිමි } කොළ අතු, සත්ත්ව හම් මගින් සාදාගත් ඇඳුම්

ශාකවල වැඩීමට හිරු එළියේ බලපෑම හඳුනා ගනිමු.

මෙහි දී හොඳින් හිරුඑළිය වැටෙන තණකොළ සහිත බිම් කොටසක් පොල්කටුවකින් වසා දින කිහිපයක් තබන්න. ඉන්පසු ව පොල්කටුව පිටතට ගත් විට එම ස්ථානයේ තණකොළවල කොළ පැහැය නැති වී ගොස් වියළුණු ස්වාභාවයක් දැකීමට හැකි වෙයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com